සකුණ ව්‍යාපාරයේ 2020-06-30 දිනට බැංකු ප්‍රකාශනයේ රු. 133 000 ක බැර ශේෂයක් පැවතිණි. එදිනට ව්‍යාපාරයේ මුදල් ශේෂය මෙයට වෙනස් අගයක් ගන්නා ලදී.

වෙනසට හේතු සොයා බැලීමේදී පහත කරුණු අනාවරණය විය.

1. බැංකු ප්‍රකාශනයේ ඇතුළත්ව තිබූ පහත දෑ ව්‍යාපාරයේ මුදල් ගිණුමේ ඇතුළත්ව නැත.
   බැංකු ගාස්තු රු. 6 000
   රක්ෂණ ගාස්තු (ස්ථාවර නියෝග) ගෙවීම රු. 13 500
   ලද ලාභාංශ රු. 7 000
   තැන්පත් කළ අගරු චෙක්පත් රු. 5 600
2. රු. 8 500 ක් වූ තැන්පත් කිරීමට යවන ලද චෙක්පතක් මුදල් ගිණුමේ රු. 8 000 ක් ලෙස සටහන් වී ඇත.
3. ජූනි මාසය තුළ තැන්පත් කිරීමට යවන ලද චෙක්පත් වලින් රු. 20 000 ක චෙක්පත් මෙතෙක් උපලබ්ධි වී නැත.
4. ඩිල්කා සමාගමට නිකුත් කළ රු. 35 000 ක චෙක්පත් 2020-07 -02 දින ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබිණි.

අවශ්‍ය වන්නේ -

1. 2020-06-30 දිනෙන් අවසන් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය
2. 2020-06-30 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්විය යුතු මුදල් ශේෂය
3. 2020-06-30 දිනට බැංකු ප්‍රකාශය ලැබීමට පෙර තිබූ මුදල් ශේෂය